# Living the LOTUS

Buddhism in Everyday Life

5 2018

VOL. 152


FOUNDER'S ESSAY

## අතු හා කොළ වලට වඩා කඳ වැදගත්ය

මුළු දවසම ගත කර වාද විවාද කලත්, අවසන් තීන්දුවක් නොමැතිව නිමාවන රැස්වීම් ඉදහිට තිබේ. එයට හේතුව රැස්වීමේ වැදගත්කමට අදල නොමැති කරුණු වලට සිත යොමු කිරීම වේ.

යම් කටයුත්තකදී තමාට කොපමණ ශාරීරික දයකත්වයක් දැක්විය හැකිද, කොපමණ පරිත්‍යාගයක් කිරීමට හැකිද යන්න පිළිබඳව අදහසක් ඇතිව සාකච්ඡාවට දයක වන්නේ නම් වාද විවාද වලින් තොරව තීරණ ගැනීමට හැකිවේ. එසේ නොකර තමාට කිරීමට නොහැකි කරුණු කාරණා ගැන නැවතීමක් නොමැතිව පැහැදිලි කරයි.

එසේ වීමට හේතුව කල්පනා කර බැලීමේදී, තමාගේ තත්වයට අවාසියක් නොවන ආකාරයට කටයුතු සිදු කිරීමට උත්සහ ගැනීම නිසා බව අවබෝධ විය.

ගසක වුවද ඕනෑවට වඩා අතුපතර ප්‍රමාණය වැඩි වුවහොත් නියමාකාරයෙන් සුළඟ වැදෙන්නේ නැතිව හා හිරු එළිය හොඳින් වැටෙන්නේ නොමැතිව කඳෙහි වර්ධනය බාල වේ. ආයතනයක් වුවද එසේමය, අපි නොදැනුවත්වම විහිදුනු අතු පතර පමණක් වැදගත්කොට සැලකීමෙන් කළ යුතු රාජකාරි සීමා වී, වැදගත්ම දේ මඟ හැරෙන්නට පුළුවන.

අප සංවිධානය අරමුණු කරනුයේ, මනුෂ්‍යයින්ව බුද්ධ මාර්ගයට ගෙන, තමනුත් ඔවුන් සමඟ බුද්ධ මාර්ගයේ ගමන් කිරීම තුලින් නියම සතුට ළඟා කර ගැනීම වේ. එම වැදගත්කම නියමාකාරයෙන් සිතට ධාරණය කරගෙන, කපා ඉවත්කල යුත්තේ කුමන අතුද, හොඳින් ආරක්ෂා කර වර්ධනය ලබාදිය යුත්තේ කුමන අතු වලටද යන්න බුද්ධිමත්ව තීරණය කල යුතු වේ.

*Kaiso zuikan* 9 පි. 50-51


Living the Lotus
Vol. 152 (May 2018)



Rissho Kosei-kai International
Fumon Media Center 3F, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537 Japan
Tel: +81-3-5341-1124
Fax: +81-3-5341-1224
E-mail: living.the.lotus.rk-international@kosei-kai.or.jp



**Senior Editor:** Koichi Saito
**Copy Editors:** P.A.D. Somapala, G.N. Ruklanthi
**Editor:** Eriko Kanao
Editorial Staff of RK International


රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදී නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මුලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත් , කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන , සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි. වර්තමානයේදී නිච්කෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මුලිකත්වයෙන් , සාමාජික සාමාජිකාවන් සෑම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැඳගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙද ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවු ලස්සන නෙලුම් මලක් සේ තම ජීවිතය සමෘද්ධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවු සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවු අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු කරනු ලැබේ.



*President's Message*

# සතුටින් ජීවිතය ගත කිරීම

නිචිකෝ නිවානෝ
රිෂ්ෂෝ කෝසෙයි සංවිධාන ප්‍රධානී තුමා

## වඩාත් සතුටුදායක දේ කුමක්ද

මේ වසරේ ජනවාරි හා පෙබරවාරි මාස වල ජපානයේ සෑම තැනකටම අධික හිම පතනයක් සිදු විය. අප සංවිධානය විසින් පවත්වන අධික ශීත කාලයේ සූත්‍ර සජ්ඣායනත් ඒ දිනවලම පැවතීම නිසා, විශාල පිරිසකට ධර්ම මධ්‍යස්ථාන වලට යාමට නොහැකි විය. ටෝකියෝ වලද ප්‍රවාහනය මාධ්‍යය සියල්ලම ඇණ හිටින තරමට අධික හිම පතනයක් සිදු වූ එම කාලයේ, දයිසෙයිදෝව තුලින් මෙවැනි මැසිවිලි හඬ ඇසුනි.

'හැම කෙනෙක්ම විශේෂ කැපවීමෙන් අධික ශීත කාල සූත්‍ර සජ්ඣායනයට සහභාගී වන වේලාවේ මේ ආකාරයට හිම වැටෙන්නේ මන්ද!'. අළුයම් කාලයේ නිවෙස් වලින් පිටත්ව, බස් රථයෙන් හෝ වාහන වලින් වාගේම දුම්රියෙන් වන්දනාවට සහභාගී වෙන අයට හිම වැටීම මහත් බාධාවක් නිසා මැසිවිලි නැගීම සාමාන්‍ය දෙයකි.

තවත් විටෙක, මේ ආකාරයේ හඬක්ද ඇසිනි.
'හිම වැටීමේ පිහිටෙන්, අධික ශීත කාල සූත්‍ර සජ්ඣායන නියමාකාරයෙන් පුහුණුවේ යෙදීමට හැකිවීම කෘතවේදීයි'

එසේනම්, ඔබලා සිතන්නේ ඉහත ආකාර දෙකෙන් කුමන ආකාරයට කල්පනා කිරීම තුලින් සතුටින් ජීවත්වීමට හැකිවේද?

මම නම් දෙවන ආකාරය හොද යැයි සිතමි. එම තැනැත්තා අසීරු දෙයක් කියන්නේ නැත. ස්වභාව ධර්මයේ වෙනස දෙස අවංකවම බලා, ඒ ආකාරයටම භාර ගැනීම ඉතා විශිෂ්ඨයි. එලෙස, අවංකවම භාර ගැනීම පමණක් කරන නමුත්, තමාගේත් අවට සිටින අයගේත් සීතල හා නිදිමත පලවා හරින ආකාරයේ හැගීමක් දැනෙන්නේ මක් නිසාද?.

එය සෑම සියළුදෙයක්ම, 'නිවැරදි දැක්මෙන්' අප බලනවාද, නැතිද යන්න මත වෙනස් වේ.

## මධ්‍යම ප්‍රතිපදාව (මධ්‍යස්ථබව) වැදගත්ය

බුදු දහමේ දේශනා කරන 'ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ' 'නිවැරදි දැක්මෙහි', 'නිවැරදි' යන වචනයේ අරුත දැනෙන්නේ, පහසුවෙන්ම කල නොහැකි, ධර්මාවබෝධය ලබා ගත් අයට පමණක් තේරුම්ගත හැකි දේවල් යැයි සිතීමට පෙළඹේ. 'නිවැරදි දැක්මෙන් කටයුතු කල යුතුය' ලෙස පවසන විට, ' අපෝ එකනම් කරන්න අමාරුයි' ලෙස ක්ෂණිකව ප්‍රතිචාර දක්වන අයද සිටියි. කලින් සඳහන් කළ හිම පතනය සිදු වු දින උදාහරණය වාගේ, ස්වභාව ධර්මයේ ක්‍රියාකාරීත්වය අවංකව භාරගැනීම - 'නිවැරදි දැක්ම' නොවේද?

'නිවැරදි දැක්ම' යනු, නපුරු සිතුවිලි හා පක්ෂග්‍රාහි සිතුවිලි වාගේ ආත්මාර්ථකාමි හැඟීමෙන් බලන විට සිතට එන දෝෂාරෝපන හා අතෘප්තිය, නැතිනම් කේන්ති එන සිදුවීම් පුළුල් හදවතකින් භාරගැනීම තුලින් හැඟීම සැහැල්ලුවට පත් කර ගැනීම වේ. බුද්ධ ඥානය හා සෑම සියළුදෙයකම යථාර්තය අවබෝධ කර ගත යුතු යැයි පවසන විට තේරුම් ගැනීමට අපහසු වූවත්, හිම වැටීමේ සිදුවීම මෙන් 'ප්‍රඥාව ඇතිකර ගන්නා ආකාරයට' කල්පනා කිරීම, අපගේ එදිනෙදා ජීවිතයටද ප්‍රයෝජනවත් වේවි.


ළඟකදී හෘද සැත්කමක් කල තැනැත්තෙක් 'මම මෙතුවක් කාලයකට හදවතේ ක්‍රියාකාරිත්වයට කෘතවේදී වී නැහැ. නමුත් දැන් හදවතේ ක්‍රියාකාරිත්වය සාමාන්‍ය දෙයක් නොවන බව අවබෝධ වුනා' යැයි නිතර නිතරම පැවසූහ. 'ඒ ආකාරයට සිතීම නිවැරදි දැක්මවේ' ලෙස මට කියාදුන්නා යැයි සිතමි.

අපගේ අවධානය නොමැති වූවද හදවත විවේකයක් නොගෙන කටයුතු කරයි. එම ස්වභාවික සුදනම ගැන පැහැදී, කෘතවේදීවීම රෝගබිය දුරු කර, හැඟීම් සැහැල්ලුවට පත් වන බව එම කරුණින් අවබෝධ වුනි. එසේම මේ මොහොත, මෙතැන ජීවත් වනවා යන යථාර්තය 'නිවැරදි දැක්මෙන්' බැලුකල අසනීපයන් වුවද කෘතවේදීත්වය අවබෝධ කරගත හැකි අවස්ථාවක් බව නැවතත් ඉගෙන ගැනීමට හැකිවිය.

'අනිත්‍ය, අනාත්ම, දුක' යන සත්‍යයට අනුව සෑම සියළුදෙයක්ම දැකීම. එය 'දුක නැති කරන නිවැරදි මාර්ගය' ලෙස කියාදෙන 'ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ' 'නිවැරදී දැක්ම' වේ. එය බුදුන් වහන්සේගේ ධර්මයට අනුකූලව ජීවත්වීමේ මුලිකම දේ වනවා සේම, මුළු ධර්මය ලෙසද පැවසිය හැකිය.

එසේම සතුටේ ගිලී ජීවත්වීම, දුකින් හා ආශාවන්ට බැදෙන්නෙත් නැතිව 'මධ්‍යස්තව' ජීවත්වීම කියාදෙන්නේ බුදු දහම වන බැවින්, ප්‍රායෝගිකව දහම පුහුණුවේ යෙදෙන්නේ නැතිනම් ප්‍රතිපලයක් නැත. එබැවින්, 'නිවැරදි' යන වදනේ අරුත සමඟම ඉදිරියට 'ආර්ය අෂ්ඨාංගික මාර්ගය' ගැන කථා කිරීමට සිතමි.

From *Kosei*, May 2018



# Spiritual Journey



## අන්‍යයන්ගේ තත්වය අවබෝධ කරගෙන, ඔවුන් ගැන සිතා කටයුතු කිරීමේ වැදගත්කම ඉගෙන ගතිමි.



බ්‍රසීල ශාඛාව
පෙඩ්‍රෝ කසෙල්ලා නෙත්තො

මෙය 2017 වසරේ ඔක්තොම්බර් මස 08 වන දින බ්‍රසීල ශාඛාවේ පැවති නිර්මාතෘ තුමාගේ ගුණානුස්මරන උත්සවයේදී පැවැත්වුවකි.

මගේ නම පෙඩ්‍රෝ කසෙල්ලා නෙත්තෝ. ගෘහ නිර්මාණ ශිල්පියෙකු ලෙස රැකියාවේ නිරතවෙලා සිටිනවා. තවම අවිවාහකයි. සුරතල් සතුන් ඇතිකරන්නේ නැති උනත් ලස්සන ශාක වර්ග දෙකක් ආදරයෙන් ඇතිදැඩි කරනවා.

මම බටනලා වාදන කරන නිසා එක් දිනක් වාදන කණ්ඩායමක් සමග බ්‍රසීලයේ රිෂ්ෂෝ කෝසෙයි සංවිධානයේ පැවති උත්සවයකට 2010 වසරේදි සහභාගි වුනා. ඒ මම රිෂ්ෂෝ කෝසෙයි සංවිධානයට ගිය පලවෙනි දවසයි.

කලක සිට බුදු දහම ඉගෙන ගන්න ඕනා කියලා කල්පනා කරගෙන සිටියා. බුදු දහම ගැන ලියවුනු පොත් කියවමින් සිටියා වුනත්, පන්සලකට ගිහින් තිබුනේ නැහැ. පොඩි කාලේ කතෝලික පාසලක ඉගෙනුම ලබමින් බෞතීස්ම වී හොදින් කාලය ගතකලා. පාසල් යන අවධියේදී වියලි ආහාර පාන ඇඳුම් පැළඳුම් එකතු කරමින් දුප්පත් අයට බෙදදෙන වැඩසටහන් වලට සහභාගි වී කටයුතු කලා. කිතුනු බැතිමතුන්ගේ උත්සව වලටද සහභාගි වෙමින්, නත්තල් කාලයට නත්තල් සීයා වී කටයුතු කරන අයට උදවු උපකාර කරමින් පොඩි ළමුන්ට තෑගි බෝග බෙදදීමේ වැඩකටයුතු වලට සහභාගි වුනා. ඒ වුනත් මොකක්දෝ අඩුවක් මගේ හිතට දැනිමට පටන් ගෙන කතෝලික ඇදහීමෙන් ටිකෙන් ටික ඈත්වී, මට හොදටම ගැළපෙන ආගමක් නැතිදෝ කියා සොයන විට, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය හා සම්බන්ධ වීමට හැකිවුනේ. සංවිධානයේ සාමාජිකයන් හැමදෙනාම මාව සුහදව පිලිගනු ලැබුවා. ඉන්පසු මම සංවිධානයේ විවිධ වැඩසටහන් වලට සහභාගි වීමට පටන් ගත්තා.



ගුණානුස්මරන උත්සවයේදී සෙප්පෝව පවත්වන නෙත්තො මහතා

මට රිෂ්ෂෝ කෝසෙයි සංවිධානයෙන් ගොඩාක් වටිනා දෑ ඉගෙන ගැනීමට හැකියාව ලැබුනා. මිනිසුන්ව විවේචනය නොකිරීම ඉන් එක් ඉගැන්වීමකි. 'මිනිසුන් විවිධ දේ කරනවා, එයට හේතුව එකිනෙකාගේ අරමුණු වෙනස් නිසා' නිසා බවද ඉගෙන ගන්න ලැබුනා. තවද, තමන් සිතන ආකාරයටම හැමදේම සිදුනොවුනත් දුක්නොවී කටයුතු කිරීමද ඉගෙනගත්තා. එම දේවල් කරන්න අමාරු දේ ලෙස සිතුනත්, තමන් සිතන ආකාරයට හැමදේම සිදුනොවෙන විට, 'තමා සිතන පතන ආකාරය' වෙනස් කර බැලිය යුතුය. තවද සිදුවන සෑම දෙයකටම අනිවාර්යයෙන්ම හේතුවක් ඇතිබවද ඉගෙන ගැනීමට ලැබුනා.

මම පොඩි කාලයේදී දෙමව්පියන් මගේ ඉදිරිපිට නිතරම රණ්ඩුවන අවස්ථා තිබුනා. ඒ හැම වෙලාවකදීම අපි, දෙමව්පියන් විදියට කුමක් කලයුතුද කියා මගෙන් විමසන්නට වුනා. ඒ නිසා මමත්, කුමන ආකාරයටද දෙමව්පියන්ගේ රණ්ඩු විසදන්න පුලුවන් වෙන්නේ කියා හැමවෙලාවෙම කල්පනා කලා. දැන් මම සංවිධානයේ කියලා දෙන ඉගැන්වීම් පොතක ලියාගෙන අම්මත් සමග දුරකථනයෙන් කථා කරන විට අම්මට කියලා දෙනවා. ඒවාගේම තාත්තාගේ හොඳ ගතිගුණ ධනාත්මකව පෙන්වා දෙමින් සිටිනවා. ඒ වාගේම තාත්තා සමගත් බුදුදහමේ ඉගැන්වීම් ගැන කතා කරන්නත් පෙළඹුනා.

'බුදු දහමේ කියා දෙන්නේ අන් අය වැරදි කියා විවේචනය කිරීම නොව, නිතරම තමා විසින් සමාව ගැනීම වැදගත් බවයි' ලෙස දෙමවුපියන්ට පහදා දුන්නා. ඉන් පසු බුදු දහම පිළිබඳ දෙමව්පියන් එකිනෙකා දරන අදහස් හුවමාරු කරගෙන ධර්මය පිළිබඳ පැහැදීමට පත්වුනා. එය මටද ගොඩක් ලොකු සතුටක් ගෙනදෙන්නක් වුනා. දෙමවුපියන් ඉස්සරට වඩා දැන් ගොඩාක් එකමුතුව වැඩ කටයුතු කරනවා.

මාගේ පවුලේ තවත් ප්‍රශ්නයක් තිබුනා. ඒ තාත්තට තව සහෝදරයෙක් සිටිනවා. සීයා නිතරම තාත්තට වඩා සහෝදරයට මුදල්මය වශයෙන් උදවු උපකාර කරනවා. එය තාත්තට මදිකමක් වුනා. එක දවසක් මම තාත්තාගෙන් මෙහෙම ඇහුවා, 'මමයි නංගියි කන්දක් නගින අතරතුර ඇවිදගන්න බැරි වෙනවා. ඒ වෙලාවේ තාත්තට අපි දෙන්නගෙන් එක් අයෙකුට විතරයි උදවු කරන්න පුලුවන් හැකියාව තිබෙන්නේ. ඉතිං තාත්තා කාවද තෝරගන්නේ' කියලා. ගොඩක් උදවු ඕනා නංගිට නිසා නංගිව තෝරාගන්නා බව මම දැනගෙන හිටියා. තාත්තා නංගිට උදවු කරලා කදු මුදුනටම ගියොත් ඒක මටත් ලොකු සතුටක් කියා පහද දුන් විට, තාත්තා මම කියපු දෙය වටහා ගත්තා. අන්‍යයන් ගැන සිතා කටයුතු කිරීමේ වැදගත්කම හා අන්‍යයන්ව හදුනා ගැනීමට උත්සහයෙන් කටයුතු කිරීමේ වැදගත්කම එයින් ඉගෙන ගත්තා. එතැන් සිට තාත්තා, සීයා සහ බාප්පා අතර රණ්ඩුව නතර වුනා.

ගෘහ නිර්මාණ ශිල්පියෙක් විධියට මම, ගෙවල් නිර්මාණය හා ඉදිකිරීම් කරනවා. එක් අවස්ථාවක නිවසක් සෑදීමට ගස් කිහිපයක් කපා දැම්මට සිදු වුනා. එම ගස් කපා දැමීම මට ලොකු දුකක් වුන නිසා, එයට උපදේශයක් ගැනීමට බ්‍රසීල ශාඛා ප්‍රධානී නකහර කියොකයිචෝ සාන් හමුවීමට ගියා. එහිදී ක්යෝකයිචෝ සාන් මට පැවසුවේ, 'මෙම ධර්ම මධ්‍යස්ථානය ඉදිකිරීමේදීත් මෙතන තිබුන ගස් කැපීමට සිදුවුනා. ඔබටත් රැකියාවේ අවශ්‍යතාවයන් වෙනුවෙන් ගස් කැපීමට සිදුවූවත්, අපි වෙනුවෙන් ජීවිත පරිත්‍යාග කල එම ශාක වල ශක්තිය අප ජීවිත වලට බද්ධ කරගෙන, නිතරම විශාල පිරිසකගේ සුභ සිද්ධිය වෙනුවෙන් යහපත් ක්‍රියාවන්හි යෙදීමට උත්සහ ගන්න' ලෙසයි. ඒ උපදේශයේ ආකරයටම ගෙවල් මිලදී ගත් අයට ප්‍රශ්ණ ඇති වු විට උදවු උපකාර සිදුකලා. ඒ පිහිටෙන් මට ගොඩක් මිත්‍රයන් ඇතිකර ගැනීමට හැකි වුනා. කපා දැමූ ගස් වෙනුවට ඒ වාගේම ගස් පැළ කිරීමත් සිදුකලා. දැන් එම ගස් හොදින් වර්ධනය වී සිහිලැල් සෙවන දෙමින් හා කුඩා කුරුල්ලන්ට නිවහන් බවටද පත්වී තිබෙනවා.

මම බ්‍රසීලයේ රිෂ්ෂෝ කෝසෙයි සංවිධානයට ගොඩක් ආදරෙයි. සාමාජිකයන්ට වාගේම මේ තැනටද ගොඩාක් ආසයි. බුදු දහමේ ඉගැන්වීම් වලටද මම ඉතාමත් කැමතියි.

දේශන වැඩමුලුවලට සහභාගි වී ධර්මයේ මූලික ඉගැන්වීම් තුලින් දුක පිළිබඳ ගොඩක් දෑ ඉගෙන ගැනීමට හැකියාව ලැබුනා. දේශන තුලදී විවිධ අය යොමුකරන ප්‍රශ්න ඇසීමටත් මම කැමැත්තක් දක්වනවා. කවුද, කොහොම, කුමන ආකාරයේ ප්‍රශ්නයන්ට මැදිවී සිත් තැවුලෙන් සිටිනවාද යන්න ඇසීමෙන්, සෑම සියළුදෙයකම සහ සබධතාව අවබෝධ කට ගැනීමට හැකි වන නිසා නොඉවසිල්ලෙනුයි නිතරම සිටින්නේ.

මීට අවුරුදු 2 කට කලින් මාගේ නිවසේ බුද්ධ රූපය තැන්පත් කරනු ලැබුවා. එම දවස මාගේ ජීවිතයේ වැදගත්ම දවසක් වුනා. බුදුන් වහන්සේගේ ඉදිරිපිට සූත්‍ර සක්ඣායනයෙන් පසු බටනලාවද වාදනය කලා.

මෙතන් සිට මාගේ ජීවිත කාලය පුරාවට අන්‍යයන්ට ගෞරව කරමින්, අන්‍යයන් ගැන සිතීම නිතරම පුරුදු පුහුණු වෙන බව දිවුරා පොරොන්දු වෙමි.

බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී ධර්මයට නමස්කාර වේවා.

නික්යෝ නිවානෝ තුමාට ස්තුති පූජා වේවා.

නිචිකෝ නිවානෝ තුමාටත් බොහොම ස්තුතියි.

සාමාජික ඔබ සියළුදෙනාටත් බොහොම ස්තුතියි.



*බ්‍රසීල ශාඛාවේ පවත්වන ධර්ම සම්මන්ත්‍රණයකදී ශබ්ද පරිපාලන රාජකාරිය කරන නෙත්තො මහතා*

# The 7 Parables of the Lotus Sutra

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය
8 වන පරිච්ඡේදය

## හිස බැඳ සිටින්නා වූ ජටාවේ තිබෙන්නා වූ මුතුකැටයේ උපමාව

## සාමකාමී පුහුණුවීම



එක් රටක ඉතා විශාල බලයක් සහිත චක්‍රවර්තී රජ කෙනෙකු සිටියහ. එම රජ අවට තිබෙන කුඩා රජ්‍යයන් යටත් කරගැනීමට උත්සහ කලද, එම රටවල රජවරුන් එයට අකමැති විය. එහෙයින් තම හමුදව යවා යටත් කර ගැනීමට උත්සහ කලහ.



එම සටන් වලදී දක්ෂකම් පෑ හමුද සෙබළුන්ට නොයෙකුත් ත්‍යාගයන් පිරිනැමූහ. ඔවුන් පරිශ්‍රමය වර්ණනා කරමින් නිවාස, කුඹුරු,ඉඩම්, කුඩාගම්, නගරයන් ආදී ප්‍රධානය කලහ. විටෙක ඇඳුම් ආයිත්තම් හා ගෘහ භාණ්ඩද, තවත් විටෙක ඉතා වටිනා රන්, රිදී, මුතු, මැණික් ආදියත්, නිවාස වල වහල් සේවයට දසියන්ද ලබා දුන්හ. නමුදු, එම රජ තම හිස බැඳි ජටාවේ තිබූ මුතු කැටය කාටවත් ලබා දුන්නේ නැත.

මේ ලෝකයටම එවැනි මුතු කැටය හා සමාන වටිනා දෙයක් නොමැත. එය වෙන කෙනෙක්ට ලබා දුනහොත, එය ලැබූ පුද්ගලයා හා අවට ඉන්න අය පුදුමයට පත්ව වික්ෂිප්ත වන තරමේ ඉතා වටිනාකමක් ඇත. නමුත් සංසන්දනය කල නොහැකි දක්ෂතා දැක්වූ අය සිටියහොත් රජතුමා ඉතා සතුටට පත්ව එම මැණික ලබා දීමට කල්පනා කලහ.



## අර්ථකතනය

චක්‍රවර්තී රජ නම බුදුන් වහන්සේ වේ. හමුද සෙබළුන් නම් ධර්මය පුහුණුවීමට උත්සහ දරන අපගේ ස්වරූපයයි. රජට විරුද්ධ වන පිරිසෙන් තෘෂ්ණාව හා අපිරිසිදු හදවත පෙන්වයි.

අප තුල විශාලා වශයෙන් තෘෂ්ණාව තිබේ. බුදුන් වහන්සේ ඊට ගැලපෙන ආකාරයට එකිනෙක ධර්මය දේශනා කරමින් ඇලීම් වලින් අපගේ සිත මුදවා ගැනීමට මඟ පෙන්වයි. සිතේ ඇතිවන අකුසල් පරද ජයගැනීමට උත්සහ කරන අපට, බුදුන් වහන්සේ තවත් ධෛර්යය ලබාදෙමින් සතුටට පත් කිරීම සදහා කටයුතු කරයි. අප දරන පරිශ්‍රමයට ලබාදෙන ධෛර්යය චංචල හදවතක්, දුකින් මිදීමේ තත්වයන්, නිවාස, ගම් නියම්ගම්, ඇඳුම් පැලදුම්, වටිනා මැණික්, දස දසියන් ලෙස උදහරණ සේ දැක්විය හැකි වටිනා දේවල් ය.

නමුදු මෙම සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රයේ ඉගැන්වීම් පමණක් ඉතා දීර්ඝ කාලයක් කාටවක් කියා නොදුන්නහ. හිස බැදී ජටාවේ තිබෙන මුතු කැටය මෙම සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රයට අර්ථ ගැන්වේ. සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය සෑම සියළු පුද්ගලයෙකුටම ධර්මාවබෝධය වෙනුවෙන් මඟ පෙන්වන කියාදීම් අන්තර්ගතය. එතරම් ධර්ම පුහුණුවක් නොමැති පුද්ගලයන් මෙයට සවන් දුන්විට වික්ෂිප්තව, විරෝධයන් පෑමට පුළුවන, එම නිසා මෙම ධර්ම කරුණු කාරණා තේරුම් ගත හැකි තත්වයට පත් වන තෙක් මෙම වටිනා දහම රහසක් ආකාරයට වැදගත්ව තැබූහ.

අතිශ්‍රේෂ්ඨ වු සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය අවබෝධ කර ගැනීම සදහා තෘෂ්ණාව දුරු කරගෙන, හදවත පිරිසිදු කර ගැනීමේ පුහුණුව අත්‍යාවශය. ඒ අනුව අපගේ හදවත පිරිසිදු කරගෙන, අන්‍යයන් වෙනුවෙන් යහපත් ක්‍රියාවන් කර කුසලයන් එකිනෙක ගොඩගසා ගැනීමෙන්, සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රයේ නියම අරුථ හොදකාරවම අවබෝධ කර ගැනීමට හැකිවේ.

අපගේ හදවත පිරිසිදු වී තිබෙන බව අවබෝධ කර ගත් බුදුන් වහන්සේ අවසානයේදී විශිෂ්ඨ වු ධර්මය දේශනා කලහ. බුදුන් වහන්සේ අපව විශ්වාස කර වටිනම වස්තුව අපට ලබාදුන්හ. අප එම ධර්මය විශ්වාසයෙන් පිළිගෙන, අප විසින්ම ධර්මයේ වටිනාකම වැඩිවෙන ආකාරයට කටයුතු කරමු.

සංස්කරණ සභය Chuo Academic Research Institute







## ධර්මයට අනුකූලව ජීවත්වීම

පාසල් යන අවධියේදී, ඉංග්‍රීසි භාෂාවෙන් මාස වල නම් පාඩම් කිරීමේදී ඉතා කෙටි නිසා මැයි මාසය ඉක්මණින් මතක තබා ගැනීමට හැකි විය. එකල ඉගෙනගත් 'මාර්තු මස සිහිලැල් සුළඟින් අප්‍රේල් මස දැඩි වර්ෂාවෙන් පසු පිපෙන්නේය මල් මැයි මාසයේ' යන කවිය අදටත් මතකයේ තිබේ. එය ස්වභාව ධර්මයේ පෙර සුදනමේ ආශ්චර්යය නිතර නිතර දැනෙන වදනකි.

නිච්කෝ නිවානෝ තුමාගේ මේ මස ධර්ම පණිවුඩය 'සතුටින් ජීවත්වීම' තුල, ස්වභාව ධර්මයේ වෙනස අවංකවම භාරගෙන කටයුතු කිරීමේ වැදගත්කම පෙන්වාදී තිබුනි.

බුදු දහමේ මධ්‍යයම ප්‍රතිපදාව යන මැදහත් බවින් කියාදෙන්නේ, ඇති සැටියෙන් යම් දෙයක් දකින් ආකාරය වන, ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ 'නිවැරදි දැක්ම' ත් සත්‍යයට අනුකූලව සෑම සියළුදෙයක් දෙස බැලිම අර්ථ ගැන්වේ.

රි.කෝ.කා. අන්තර්ජාතික මුලස්ථාන ප්‍රධානී
කෝයිචි සයිතෝ මහතා




## Rissho Kosei-kai International Branches

We welcome comments on our newsletter *Living the Lotus*: living.the.lotus.rk-international@kosei-kai.or.jp

Rissho Kosei-kai

# Overseas Dharma Centers 2018

**Rissho Kosei-kai International**
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo, Japan
*Tel:* 81-3-5341-1124 *Fax:* 81-3-5341-1224

**Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First Street Suite #1 Los Angeles CA 90033 U.S.A
*Tel:* 1-323-262-4430 *Fax:* 1-323-262-4437
*e-mail:* info@rkina.org http://www.rkina.org

**Branch under RKINA**

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way,
WA 98003 U.S.A.
*Tel:* 1-253-945-0024 *Fax:* 1-253-945-0261
e-mail: rkseattlewashington@gmail.com
http://buddhistlearningcenter.org/

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
6083 Babcock Road, San Antonio, TX 78240, U.S.A.
P.O. Box 692148, San Antonio, TX78269, USA
*Tel:* 1-210-561-7991 *Fax:* 1-210-696-7745
*e-mail:* dharmasanantonio@gmail.com
http://www.rkina.org/sanantonio.html

**Rissho Kosei-kai of Tampa Bay**
2470 Nursery Road, Clearwater, FL 33764, U.S.A.
*Tel*: (727) 560-2927 *e-mail*: rktampabay@yahoo.com
http://www.buddhismtampabay.org/

**Rissho Kosei-kai of Vancouver**

**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, U.S.A.
*Tel:* 1-808-455-3212 *Fax:* 1-808-455-4633
*e-mail:* info@rkhawaii.org http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1817 Nani Street, Wailuku, HI 96793, U.S.A.
*Tel:* 1-808-242-6175 *Fax:* 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona,
HI 96740 U.S.A.
*Tel:* 1-808-325-0015 *Fax:* 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, U.S.A.
*Tel:* 1-323-269-4741 *Fax:* 1-323-269-4567
*e-mail:* rk-la@sbcglobal.net http://www.rkina.org/losangeles.html

**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
1031 Valencia Way, Pacifica, CA 94044, U.S.A.
*Tel:* 1-650-359-6951 *Fax:* 1-650-359-6437
*e-mail:* info@rksf.org http://www.rksf.org

**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016 U.S.A.
*Tel:* 1-212-867-5677 *Fax:* 1-212-697-6499
*e-mail:* rkny39@gmail.com http://rk-ny.org/

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056 U.S.A.
*Tel :* 1-773-842-5654 *e-mail:* murakami4838@aol.com
http://home.earthlink.net/~rkchi/

**Rissho Kosei-kai of Fort Myers**
http://www.rkftmyersbuddhism.org/

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
2745 N.W. 40th Street, Oklahoma City, OK 73112 U.S.A.
*Tel & Fax:* 1-405-943-5030
*e-mail:* rkokdc@gmail.com http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai, Dharma Center of Denver**
1255 Galapago Street, #809 Denver, CO 80204 U.S.A.
*Tel:* 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
425 Patterson Road, Dayton, OH 45419 U.S.A.
http://www.rkina-dayton.com/

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP,
CEP 04116-060 Brasil
*Tel:* 55-11-5549-4446 / 55-11-5573-8377
*Fax:* 55-11-5549-4304
*e-mail:* risho@terra.com.br http://www.rkk.org.br

**Risho Kossei-kai de Mogi das Cruzes**
Av. Ipiranga 1575-Ap 1, Mogi das Cruzes-SP,
CEP 08730-000 Brasil
*Tel:* 55-11-5549-4446 / 55-11-5573-8377

**Rissho Kosei-kai of Taipei**
4F, No. 10 Hengyang Road, Jhongjheng District,
Taipei City 100 Taiwan
*Tel:* 886-2-2381-1632 *Fax:* 886-2-2331-3433
http://kosei-kai.blogspot.com/

**Rissho Kosei-kai of Taichung**

**Rissho Kosei-kai of Tainan**
No. 45, Chongming 23rd Street, East District,
Tainan City 701 Taiwan
*Tel:* 886-6-289-1478 *Fax:* 886-6-289-1488

**Rissho Kosei-kai of Pingtung**

**Korean Rissho Kosei-kai**
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
*Tel:* 82-2-796-5571 *Fax:* 82-2-796-1696
*e-mail:* krkk1125@hotmail.com

**Korean Rissho Kosei-kai of Busan**
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
*Tel:* 82-51-643-5571 *Fax:* 82-51-643-5572

**Branches under the Headquarters**

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road,
North Point, Hong Kong, Republic of China

**Rissho Kosei-kai of Ulaanbaatar**
15F Express tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
*Tel:* 976-70006960 *e-mail:* rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Sakhalin**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk
693005, Russian Federation
*Tel & Fax:* 7-4242-77-05-14

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29-00184 Roma, Italia
*Tel & Fax :* 39-06-48913949 *e-mail:* roma@rk-euro.org

**Rissho Kosei-kai of the UK**
**Rissho Kosei-kai of Venezia**
**Rissho Kosei-kai of Paris**

**International Buddhist Congregation (IBC)**
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo, Japan
*Tel:* 81-3-5341-1230 *Fax:* 81-3-5341-1224
*e-mail:* ibcrk@kosei-kai.or.jp http://www.ibc-rk.org/

**Rissho Kosei-kai of South Asia Division**
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel*: 66-2-716-8141 *Fax*: 66-2-716-8218

**Rissho Kosei-kai International of South Asia (RKISA)**
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel*: 66-2-716-8141 *Fax*: 66-2-716-8218
*e-mail*: thairissho@csloxinfo.com

**Branches under the South Asia Division**

**Rissho Kosei-kai of Central Delhi**
224 Site No.1, Shankar Road, New Rajinder Nagar, New Delhi,
110060, India

**Rissho Kosei-kai of West Delhi**
66D, Sector-6, DDA-Flats, Dwarka, New Delhi 110075, India

**Rissho Kosei-kai of Kolkata**
E-243 B. P. Township, P. O. Panchasayar, Kolkata 700094, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road
Rumpur, Gaya-823001, Bihar, India

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsilhel, Sancepa-1, Lalitpur,
Kathmandu, Nepal

**Rissho Kosei-kai of Phnom Penh**
#201E2, St 128, Sangkat Mittapheap, Khan 7 Makara,
Phnom Penh, Cambodia

**Rissho Kosei-kai of Patna Dharma Center**
**Rissho Kosei-kai of Singapore**

**Thai Rissho Friendship Foundation**
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel:* 66-2-716-8141 *Fax:* 66-2-716-8218 *e-mail:* info.thairissho@gmail.com

**Rissho Kosei-kai of Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
*Tel & Fax:* 880-31-626575

**Rissho Kosei-kai of Dhaka**
House#408/8, Road#7(West), D.O.H.S Baridhara,
Dhaka Cant.-1206, Bangladesh
*Tel:* 880-2-8413855

**Rissho Kosei-kai of Mayani**
Mayani(Barua Para), Post Office: Abutorab, Police Station: Mirshari,
District: Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Patiya**
Patiya, sadar, Patiya, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Domdama**
Domdama, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Cox's Bazar**
Ume Burmese Market, Main Road Teck Para, Cox'sbazar, Bangladesh

**Rissho Kosei-kai of Satbaria**
Satbaria, Hajirpara, Chandanish, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Laksham**
Dupchar (West Para), Bhora Jatgat pur, Laksham, Comilla,
Bangladesh

**Rissho Kosei-kai of Raozan**
West Raozan, Ramjan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Chendirpuni**
Chendirpuni, Adhunagor, Lohagara, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Ramu**

**Rissho Kosei Dhamma Foundation, Sri Lanka**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
*Tel:* 94-11-2982406 *Fax*: 94-11-2982405

**Rissho Kosei-kai of Habarana**
151, Damulla Road, Habarana, Sri Lanka

**Rissho Kosei-kai of Polonnaruwa**

**Other Groups**
**Rissho Kosei-kai Friends in Shanghai**